Prepared by- එච්.ටී.ඩී.ජයවර්ධන

කලාප අධ්‍යාපන කාර්යාලය - ඇඹිලිපිටිය

Department of Education,Sabaragamuwa Province/ Weekly School

<u>ශ්‍රී ලංකාවේ පාරම්පරික පිත්තල කලා කර්මාන්තය</u>

ඓතිහාසික පසු බිම - අනුරාධපුර යුගයේ පැවතුන බවට සාධක ඇත. 18 වන සියවසේ දී ප්‍රචලිත වී ඇත.

පිත්ලත සඳහා භාවිත අමු ද්‍රව්‍ය - තඹ ( Copper ) සහ තුත්තනාගම් ( Sinc )

<u>පිත්තල භාණ්ඩ නිර්මාණයේ අවශ්‍යතාව</u>

| | අවශ්‍යතාව | භාණ්ඩය |
|---|---|---|
| 1 | පාරිභාරික භාණ්ඩ | තට්ටු පහන්,පඩික්කම්,ගිරා,කළගෙඩි,බන්දේසි,කොතල,සෙම්බු, |
| 2 | ගොඩනැඟිලි සහ ගෘහ භාණ්ඩ සඳහා භාවිත ද්‍රව්‍ය | ඇණ, සරණේරු,යතුරු තහඩු හා මුහුණත් තහඩු,යතුරු |
| 3 | ආගමික කටයුතුවලට අවශ්‍ය භාණ්ඩ | ධාතු කරඬු,චෛත්‍ය කොත්,පිළිම,පාත්‍රා,සීනු,සේසත්,ශ්‍රී පාද සළකුණු |
| 4 | අලංකරණ භාණ්ඩ | බිත්ති සැරසිලි,සත්ත්ව රූප |

පිත්තල භාණ්ඩ නිර්මාණය කරන ශිල්ප ක්‍රම 2කි.

1. තළන වැඩ හෙවත් තහඩු වැඩ - මෙහිදී පිත්තල තහඩු උපයෝගී කරගනිමින් භාණ්ඩ නිර්මාණය කරයි. පැතලි ස්වරූපයක් ගන්නා භාණ්ඩ නිර්මාණය පුමුඛ වේ. ( බන්දේසි,යතුරු තහඩු,ආභරණ පෙට්ටි පියන්,කණප්පු තට්ටු )
2. වාත්තු වැඩ - පිත්තල වාත්තු කිරීමේ ශිල්ප ක්‍රම 2කි.

I. ඉටි වාත්තු

II. පස් වාත්තු

( පිළිම,කරඬු,සත්තව රූප, කොත් )

<u>භාණ්ඩ අලංකරණ ක්‍රම</u>

- පිත්තල තහඩු ක්‍රමයට නිර්මාණය කරන ලද භාණ්ඩ පීර,නියන්, උල් කටු වැනි උපකරණ භාවිතයෙන් කැටයම් කර මප දමයි.
- සැරසිලි කිරීම සඳහා ලියවැල,අන්නාසි මල,භේරුණ්ඩ පක්ෂියා,හංස පූට්ටුව,ඉර හඳ,පලා පෙති වැනි සිංහල සැරසිලි මෝස්තර යොදා ගනි.
- සැරසිලි කිරීමේදී යකඩ,තඹ,රන්,රිදී,වැනි ලෝහ වර්ගද අවශ්‍යතාවය අනුව යොදා ගනී.

පිත්තල කලා කර්මාන්තය සඳහා ප්‍රචලිත ප්‍රදේශ

මහනුවර - පමුණුව,ගඩලාදෙණිය,පිළිමතලාව,කිරිවවිල,දවුලගල,නත්තරම්පොත ( කලාපුරය )

මාතර - බෙලිඅත්ත ප්‍රදේශයේ අහුල්මඩුව,

යාපනය - වන්නාර් පන්නෙයි

මඩකලපුව - පෙරියපොරතිවු











පැවරම

1. පිත්තල කර්මාන්තය පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න.
2. පිත්තල කර්මාන්තය ප්‍රචලිත ප්‍රදේශ නම් කරන්න.